# මහරගම නගර සභාව

## ටෙන්ඩර් දැන්වීම.

2025.02.01 දින සිට 2026.01.31 දින දක්වා කාලයට නගර සභාව සතු ගොඩිගමුව අවමංගල්‍ය ශාලාව බදු දීමට ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ.

ටෙන්ඩර් පත් නිකුත් කිරීම - 2025.01.10 දින පෙ.ව 9.00 සිට 2025.01.30 වන දින පෙ.ව 10.00 දක්වා

ටෙන්ඩර් පත් භාර ගැනිම -2025.01.30 දින ප.ව 2.00 දක්වා

ටෙන්ඩර් පත් විවෘත කිරිම -2025.01.30 දින ප.ව 2.00 ට ටෙන්ඩර්පත් භාරගැනීම අවසන් වූ වහාම

ටෙන්ඩර් පත් විවෘත කරන ස්ථානය -මහරගම නගර සභා කාර්යාලයේදී

ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේදි ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ නියෝජිතයකුට සහභාගි විය හැක.

වැඩි විස්තර සඳහා කාර්යාල දිනයන්හි අංක 011-2849138 / 011-2837682 ඇමතීමෙන් හෝ වෙබ් අඩවියෙන් ( maharagama.uc.gov.lk ) ලබා ගත හැක. ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

| වෙළඳාමේ ස්වභාවය | ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල (මුදලින් පමණක්) | ටෙන්ඩර් පෝරම ගාස්තු(රු)(වැට් රහිත) | අවම මාසික ටෙන්ඩර් මුදල(රු) |
|---|---|---|---|
| මහරගම ගොඩිගමුව අවමංගල්‍ය උත්සව ශාලාව වාර්ෂිකව බදු දීම. | 25,000/- | 2,000/- | 250,000/- |

පොදු කොන්දේසි:-

- නියමිත වේලාවට පසුව ලැබෙන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- ටෙන්ඩර් පත් බහා එවන කවරයේ වම් පස ඉහල කෙලවරේ “මහරගම ගොඩිගමුව අවමංගල්‍ය උත්සව ශාලාව බදු දීම” ලෙසට පැහැදිලිව සඳහන් කල යුතුය.
- අදාළ ස්ථානය පරික්ෂා කිරීම සඳහා සතියේ ඕනෑම දිනයක පෙ.ව 9.00 සිට ප.ව 4.00 දක්වා අවස්ථාව ඇත.(මේ සඳහා මහරගම නගර සභාවේ අවසරය ලබා ගත යුතුය.)
- ටෙන්ඩර්පත් මුල් පිටපත් හා අනු පිටපත් ලෙස වෙන වෙනම සඳහන් කර සකස් කරන ලද කවර වල බහා එම කවරය නැවත එකම කවරයක බහා මුද්‍රා තබා ලේකම්,මහරගම නගර සභාව යන නමට ලියාපදිංචි තැපැලෙන් හෝ ප්‍රධාන කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලීම කල යුතුය.
- ටෙන්ඩර් පෝරම සමඟ ලබා දෙන කොන්දේසි මාලාව පිළිගත් බවට අත්සන් කොට ටෙන්ඩරයේ මුල් පිටපතට අමුණා තිබිය යුතුය.
- ඉදිරිපත් කරන මිල ගණන් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය මහරගම නගර සභාව සතුය.
- රජය විසින් වරින් වර පනවනු ලබන හා බදු ප්‍රතිශතය වෙනස් කිරීම් වලට ටෙන්ඩර්කරු යටත් විය යුතුය.

ලේකම් හා සභාවේ බලතල කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
මහරගම නගර සභාව.

**<u>මහරගම නගර සභාව සතු ගොඩිගමුව අවමංගල්‍ය උත්සව ශාලාව</u>**

**<u>බදු දීම සඳහා වන ටෙන්ඩර් පත්‍රය -2025</u>**

ලේකම් හා සභාවේ බලතල කාර්යය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිළධාරි,
මහරගම නගර සභාව.

1. මහරගම නගර සභාවට අයත් ගොඩිගමුව අවමංගල්‍ය උත්සව ශාලාව ..............................දින සිට............................දක්වා කාලය සඳහා මාසිකව රු .......................................(අකුරෙන්)............................................................. .................(ඉලක්කමෙන්) මුදලකට බදු ගැනීමට මෙහි පහත අත්සන් කරන....... ..................................................................................................... හි පදිංචි වන මම මෙයින් ඉල්ලුම් කරමි.
2. මා විසින් ඉදිරිපත් කරන් ලබන මිල ගණන් මහරගම නගර සභාව විසින් පිළිගනු ලැබුව හොත්, පිළිගත් මාසික ටෙන්ඩර් මුදල මාගේ ටෙන්ඩරය පිළිගත් බව දන්වා දින 07 ක දී මහරගම නගර සභාවට ගෙවීමටත් ,ගිවිසුම අත්සන් කිරීමට ප්‍රථම පිළිගත් ටෙන්ඩරයේ මාසික ටෙන්ඩර් මුදල මෙන් **දෙගුණයක මුදලක් ආරක්ෂිත ඇප තැන්පතුවක්** ලෙස සභාවේ තැන්පත් කිරීමට එකඟ වෙමි.මෙම තැන්පතුව මෙහි සඳහන් වන සහ ගිවිසුම් පතේ ඇතුලත් කරනු ලබන කොන්දේසි හා වගන්ති නිසියාකාරව ක්‍රියා කිරීමේ සහතිකයක් වශයෙන් ද,මවිසින් හෝ මාගේ සේවකයකු විසින් කරන ලද හෝ පැන නගින අලාභයක්,පාඩුවක් හෝ කිසියම් ගාස්තුවක් අය කර ගැනීමේ ඇපයක් වශයෙන් ද මහරගම නගර සභාවේ ලේකම් විසින් තබා ගනු ඇත.
3. මෙම ගිවිසුම,ගිවිසුම් කාලයට පෙර අවලංගු කිරීමට සිදු වුවහොත්,මා විසින් ආරක්ෂිත ඇප තැන්පත් ලෙස නගර සභාවේ තැන්පත් කරන ලද මුදල නැවත මා හට නොලැබෙන බව මම දනිමි.
4. එදිනෙදා අවමංගල්‍ය උත්සව සංවිධානය කිරීමේදි සහ සිරුරු සැකසීමේදී ඇතිවන අපද්‍රව්‍ය පරිසර දූෂණය නොවන ආකාරයට එදිනම සෞඛ්‍යාරක්ෂිතව බැහැර කිරීමට මා විසින් සුදුසු වැඩපිළිවෙලක් යොදා ගැනීමට ද පොරොන්දු වන අතර එක් අවස්ථාවක ශාලා පහසුකම් සැපයිය හැක්කේ මෘත ශරීර දෙකක් සඳහා පමණක් බවද මම දනිමි.
5. තවද මෙහි සඳහන්ව ඇති කොන්දේසි මම පිළිගනිමි. එම කොන්දේසි හා නියමයන් නිසි අයුරු ක්‍රියාත්මක කිරීමට බද්ද පටන් ගන්නා දිනය වූ .....................................වැනි දිනට ප්‍රථම මාගේ පුද්ගලික ගිවිසුමකට බැඳීමකට පොරොන්දු වෙමි.
6. කොන්දේසි හා වගන්ති මාලාවේ ඇතුළත් වන මෙහි සඳහන් කොන්දේසි වලින් එකක් හෝ කිහිපයක් ඉටු කිරීමට මා අපොහොසත් වුවහොත්,බද්ද අවලංගු කර නැවතත් බදු දීමට මහරගම නගර සභාවට සම්පූර්ණ බලය තිබෙන බව මම දනිමි.
7. ගිවිසුම් කාලය අවසන් වීමට පෙර බදු ගිවිසුම අවලංගු කිරීමට සිදු වුවහොත් එම අවලංගු කිරීමෙන් අනතුරුව ටෙන්ඩර් පටිපාටිය අනුව ඊලග ඉල්ලුම්කරුට දීමට හෝ යලි ටෙන්ඩර් කැඳවා වෙනත් අයෙකුට බදු දිමට හෝ මහරගම නගර සභාව යුක්ති සහගත,සාධාරණ උත්සාහයක් ගෙන අපොහොසත් වුව හොත් අවලංගු කළ දින සිට වසර අවසාන වන තෙක් ඉදිරියට ගෙවිය යුතු බදු කුලී නැවත ටෙන්ඩර් කැඳවීමට හෝ ඒ වෙනුවෙන් වියදම් කරන ලද අතුරු වියදමක් වශයෙන් වන වියදම් සම්පූර්ණයෙන්ම සභාවට ගෙවීමට මම එකඟ වෙමි.

8. ටෙන්ඩර් පත්‍රය සමග පහත සඳහන් ලේඛන අයදුම්කරු ඉදිරිපත් කළ යුතුය.

I. ව්‍යාපාරයේ ස්වභාවය (තනි පුද්ගල/හවුල්)
II. ආසන්න වසර 05 ක පළපුරුද්ද පිළිබඳව විස්තර
III. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක්
IV. භාවිතා කරන අවමංගල්‍ය වර්ගය හා වෙනත් වාහන පිළිබඳ විස්තර
V. රක්ෂණ සහතික වල පිටපත්
VI. සේවය කරන සේවක සංඛ්‍යාව හා අර්ථසාධක දායකත්වය පිළිබඳ විස්තර
VII. මෘත දේහයක් එම්බාම් කිරිමට ඇති පළපුරුද්ද/සුදුසුකම් ලද සේවකයින් ගණන හා ඔවුන් පිළිබඳ විස්තර
VIII. පෙට්ටි නිෂ්පාදන පිළිබඳ විස්තර
IX. බැංකු ප්‍රකාශන වල පිටපත් හා බදු ලියකියවිලි වල ලියාපදිංචි අංක
X. මහරගම බල ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් සපයන විශේෂ සේවාවන්

.............................................. ..........................................

දිනය ටෙන්ඩර්කරුගේ අත්සන

**<u>මහරගම නගර සභාව සතු ගොඩිගමුව අවමංගල්‍ය උත්සව ශාලාව</u>**
**<u>බදු දීම සඳහා වන ටෙන්ඩර් පත්‍රය -2025</u>**

මුල් පිටපත/අනු පිටපත

කාර්යයේ ස්වභාවය ..........................................දින සිට.................................දින දක්වා මහරගම නගර සභාව සතු ගොඩිගමුව අවමංගල්‍ය උත්සව ශාලාව බදු දීමට ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍රය.

ටෙන්ඩර් කරුගේ නම ..........................................................................................

ලිපිනය ..........................................................................................

..........................................................................................

..........................................................................................

ටෙන්ඩර් ඇප තැන්පත් මුදල ................................ අයපත් අංකය ..........................

ටෙන්ඩර් ගාස්තුව .................................................... අයපත් අංකය ...........................

ටෙන්ඩර් පත්‍රය භාරගන්නා අවසාන දිනය සහ වේලාව 2025.01.30 දින ප.ව 2.00 දක්වා.

ලේකම් හා සභාවේ බලතල කාර්ය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
මහරගම නගර සභාව.

2025.01................වන දින
මහරගම නගර සභාව.